Applications.lk

Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## මාතර මහා නගර සභාව

මාතර මහා නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අවම අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| රියදුරු III ශ්‍රේණිය | 4 | රා.ප.ච. 3/2016 අනුව PL3 - වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | • අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී ඕනෑම විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුය.<br>• පුරප්පාඩුව පවතින මෝටර් රථ වර්ගයෙහි රියදුරු තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳ මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය.<br>• මෝටර් රථ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර තුනක පළපුරුද්ද ලබා තිබිය යුතුය. |
| ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණිය | 1 | රා.ප.ච. 3/2016 අනුව PL2 - වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | • අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී ඕනෑම විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතු ය.<br>• අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවයන්හි (N.V.Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබිය යුතු ය.<br>• අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ. |
| පෙදරේරු III ශ්‍රේණිය | 2 | | |

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| කාර්යාල කාර්ය සහයක III ශ්‍රේණිය | 1 | රා.ප.ච. 3/2016 අනුව PL1 - වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. |
| මුරකරු III ශ්‍රේණිය | 6 | | |
| පුස්තකාල සහායක III ශ්‍රේණිය | 5 | | |
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 12 | රා.ප.ච. 3/2016 අනුව PL1 - වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම |
| සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 31 | | |

*පොදු සුදුසුකම්:*

I. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.

III. සෑම අපේක්ෂකයකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IV. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

V. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

I. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලබන අතර, එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු පදනම් කර ගනිමින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

II. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

III. සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව සහා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබා දෙමින් පහත සඳහන් ආකාරයට ලකුණු ලබා දීම සිදු කරනු ලබයි.

IV. රියැදුරු තනතුරට බඳවා ගැනීමේ දී ව්‍යුහග සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ.

ආදාහනාගාර ක්‍රියාකරු, පෙදරේරු, කාර්යාල කාර්ය සහායක, මුරකරු, පුස්තකාල සහායක, වැඩ/ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා ලකුණු ලබා දෙන ආකාරය

| | ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් | 30 |
| 2 | වෘත්තීය සුදුසුකම් | 10 |
| 3 | පළපුරුද්ද | 10 |
| 4 | සභා බල ප්‍රදේශයේ පදිංචිය | 45 |
| 5 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 |
| | එකතුව | 100 |

තෝරා ගැනීම සලකා බැලීම සඳහා අවම ලකුණු 50ක් ලබා ගත යුතුය.

- රියදුරු තනතුරු සඳහා ලකුණු ලබා දෙන ආකාරය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීම

| | ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1 | අ.පො.ස. සා/පෙළ සාමාර්ථ සඳහා | 08 |
| 2 | අ.පො.ස සා/පෙළ සම්මාන සාමාර්ථ සඳහා | 16 |
| 3 | අ.පො.ස උ/පෙළ සමත් වීම | 04 |
| 4 | වෘත්තියට අදාළ දැනුම | 10 |
| 5 | පෞරුෂත්වය | 05 |
| 6 | වෘත්තියට අදාළ පුහුණුවක් හෝ සේවා පළපුරුද්දක් ලබා තිබීම | 15 |
| | එකතුව | 50 |

සමත් වීම සඳහා ලකුණු 20 ක් ලබා ගත යුතුය.

වෘත්තීය සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු 50ක් ලබාදෙන අතර සමත් වීම සඳහා ලකුණු 20ක් ලබාගත යුතුය. ඒ අනුව තෝරා ගැනීම සලකා බැලීම සඳහා අවම ලකුණු 40ක් ලබාගත යුතු වේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එහෙත් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් වේ.
II. වැන්දඹු හා අනන්දරු අරමුලට දායකත්වය හිමි වේ.
III. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයක සිටින සේවකයන්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම වසර තුනක සේවා කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.
IV. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයන් බැඳී සිටියි.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2019.03.31 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "නගරාධිපති, මහා නගර සභාව, මාතර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පූර්ණ බලතල මාතර මහා නගර සභාවේ නගරාධිපති සතුවේ.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපතක් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය ඃ

(i) උප්පැන්න සහතිතය
(ii) අධ්‍යාපන සහතිකය
(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.)
(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්,
(v) පළපුරුද්ද පිළිබඳ සහතිකය
(vi) මාතර මහා නර සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්
(vii) වෘත්තිය පිළිබඳ සහතික

ඩී. ජී. යසරත්න,
නගරාධිපති,
මහා නගර සභාව - මාතර.

2019 පෙබරවාරි මස 20 වැනි දින,
මහා නගර සභාව - මාතර.

මාතර මහා නගර සභාව

**............................................තනතුර සඳහා අයදුම්පත**

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————.
03. තැපැල් ලිපිනය :——————————————.
04. දුරකථනය අංකය :————————.
05. උපන් දිනය : වර්ෂය :—————— මාසය:—————— දිනය:——————
06. ජාතික හැඳුනුම්පත් අංකය :——————————
07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ- අවු.:—————— මාස :—————— දින :——————
08. ස්ත්‍රී/ පුරුෂ භාවය :——————————————.
09. විවාහක අවිවාහක බව :——————————————.
10. ජාතිය :——————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද යන වග :——————————————.
12. අධ්‍යාපන සුදුසුකම් :——————————————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————————.
14. ඔබ දැනටමත් මාතර මහා නගර සභාවේ සේවය කරන්නේ නම්
    I. දැනට දරන තනතුර :——————————
    II. එම තනතුරට පත් වූ දිනය :——————————
    III. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත ද) :——————

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙමගින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

........................................;
අයදුම්කරුගේ අත්සන.

දිනය ඃ ...................................